# ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවා දිස්ත්‍රික් කොමසාරිස් හමුවේ වාර්තාව
# 2024 පළමු සැසි වාරය

**දිනය** ： 2024 පෙබරවාරි මස 11 වන ඉරිදා දිනදිය

**වේලාව** ： පෙරවරු 9.20 සිට දහවල් 3.00 දක්වා

**ස්ථානය** ： ශාන්ත ජෝන් ගිලන් රථ ජාතික මූලස්ථානය , කොළඹ 02.

**ආරාධිත සහභාගි වූවන් ：**

| | | |
|---|---|---|
| 1. | ළමා රෝග විශේෂඥ වෛද්‍ය ජේ.එම්.නිලාම් | - ප්‍රධාන කොමසාරිස් තුමා |
| 2. | වෛද්‍ය මංජුල ප්‍රභාත් වීරගුණරත්න සහබන්දු | - පුහුණු අධ්‍යක්ෂ තුමා |
| 3. | ඒ.ආර්.එම්. ෆාසිල් | - කිට් භාර සහකාර කොමසාරිස්තුමා |
| 4. | ආර්. සිතිජ ප්‍රියංකර ප්‍රනාන්දු | - කැඩෙට් භාර සහකාර කොමසාරිස්තුමා |
| 5. | ඩී. නිර්මල අමරවික්‍රම | - වැඩිහිටි භාර සහකාර කොමසාරිස්තුමා |
| 6. | ඩී.කේ. ගාමිණී ප්‍රියනාත් | - ජාතික රාජකාරි භාර සහකාර කොමසාරිස්තුමා |
| 7. | ඒ.සී.එම්. ඉන්ෂාෆ් | - ව්‍යාපෘති භාර සහකාර කොමසාරිස්තුමා |
| 8. | ඩී.ඒ.එම්. අමල් බණ්ඩාර දස්කොන් | - නුවර දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 9. | ඩී.එම්. අජිත් දිසානායක | - නුවර අතිරේක දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 10. | ඩී.ඒ.කේ. සමරජීව | - නුවරඑළිය දිස්ත්‍රික් කොමසාරිස්තුමිය |
| 11. | එම්.ටී.නවුෂාඩ් වාෆි | - අම්පාර සමන්තුරේ දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 12. | එස්.එල්.එච්.එම්. ඉනාමුල්ලා | - මඩකලපුව මධ්‍යම දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 13. | එස්. ස්ටෙපන් | - මඩකලපුව අතිරේක දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 14. | ටී. ගොවිරිමිනන් | - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 15. | එඩ්වඩ් ඩෙලිෂාන් | - යාපනය දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 16. | ජී. ලෙස්ලි | - මන්නාරම දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 17. | සමන් දේවප්‍රිය දිසානායක | - අනුරාධපුර දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 18. | ජී. ජී. ප්‍රේම් සදනායක | - පොළොන්නරුව දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 19. | ඊ.එම්. නිමල් ධර්මරත්න | - කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 20. | ඒ.එම්. සුමිත් දර්ශන | - පුත්තලම දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 21. | එම්. බිනර ශාන්ත මාරසිංහ | - කෑගල්ල දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 22. | ආර්.ආර්. රොෂාන් කුලතුංග | - ගාල්ල දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 23. | බී.ඒ.පී.කේ. ජයසිංහ | - හම්බන්තොට දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 24. | චතුරිකා රසාංගි කුලසූරිය | - මාතර දිස්ත්‍රික් කොමසාරිස්තුමිය |
| 25. | එම්.ඒ සරත් කුමාර | - බදුල්ල දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 26. | ඩී.එම්. සරත් කුමාර | - මොණරාගල දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 27. | එම්.ඩී.පී.ඩී. සේනානායක | - කොළඹ දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 28. | රුවන් චමින්ද බාලසූරිය | - ගම්පහ දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 29. | අකලංක නිරෝදන උපුල් වික්‍රමතිලක | - කළුතර දිස්ත්‍රික් කොමසාරිස්තුමා |
| 30. | එම්. විශ්වකුල පෙරේරා | - කළුතර අතිරේක දිස්ත්‍රික් කොමසාරිස්තුමා |

**දිස්ත්‍රික් කොමසාරිස් වෙනුවට සහභාගි වූවන් ：**

1. කේ. චානක සම්පත් - රත්නපුර සහකාර දිස්ත්‍රික් කොමසාරිස්තුමා

**මූලස්ථානයෙන් සහභාගි වූවන් ：**

2. අජන්ත ජයවර්ධන - ප්‍රධාන පරිපාලන නිළධාරීතුමා
3. එම්.ඒ.ජේ. නිලංකා රොෂානි පෙරේරා - ශාන්ත ජෝන් ගිලන් හමුදාවේ සන්නිවේදන නිළධාරිනි

**සහභාගි නොවූ දිස්ත්‍රික් කොමසාරිස්වරුන්**

1. ඒ.එන්. චන්ද්‍රා ධනපාල - මාතලේ දිස්ත්‍රික් කොමසාරිස්තුමිය
2. සජිඩීන් සරාජ්ත් - වවුනියා දිස්ත්‍රික් කොමසාරිස්තුමා

**නයාය පත්‍රය අනුව දිස්ත්‍රික් කොමසාරිස් හමුවේදී සාකච්ඡා කිරීම සඳහා වූ කරුණු**

1. පිළිගැනීම - ප්‍රධාන කොමසාරිස් තුමා
2. වර්ෂ 2024 සහ 2025 ඉදිරි ගමන් මග - ප්‍රධාන කොමසාරිස් තුමා
3. සියලු දිස්ත්‍රික් තුළ කාර්ය සාධනය පිළිබඳව - ප්‍රධාන කොමසාරිස් තුමා
4. කැඩෙට් වැඩසටහන් පිළිබඳව - කැඩෙට් භාර සහකාර කොමසාරිස්තුමා
5. කිට් වැඩසටහන් පිළිබඳව - කිට් භාර සහකාර කොමසාරිස්තුමා
6. ජාතික රාජකාරී සේවාව දියුණු කිරීම පිළිබඳව - ජාතික රාජකාරී භාර සහකාර කොමසාරිස්තුමා
7. සම්මාන උළෙල පිළිබඳව සාකච්ඡා අවසානය - ව්‍යාපෘති භාර සහකාර කොමසාරිස්තුමා
8. වැඩිහිටි වැඩසටහන් දියුණු කිරීම පිළිබඳව - වැඩිහිටි භාර සහකාර කොමසාරිස්තුමා
9. අරමුදල් රැස්කිරීම හා ප්‍රචාරණ කටයුතු පිළිබඳව- සාකච්ඡා කිරීම
10. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථමාධාර වැඩසටහන් පිළිබඳව- සියළුම දෙනා
11. වෙනත් කරුණු - සියළුම දෙනා
12. ස්තුතිය පුද කිරීම

**2024/DC Meeting Agenda -01**

**පැමිණ සිටි සියලුදෙනාව කොමසාරිස්තුමා විසින් පිළිගනිමින් සභාව ඇමතීම ආරම්භ කරන ලදි.**

**2024/DC Meeting Agenda -02,03**

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් දැනුවත් කල විෂයන්**

1. ශාන්ත ජෝන් ආයතනය ආධාර සපයන ආයතනයක් නොව ගුණාත්මක පුහුණුවක් සහ සේවාවක් සපයන ආයතනයක් බවත් එහි නිළධාරීන් සියලුම දෙනා මෙම ආයතනයේ ගෞරවය රැකගෙන කටයුතු කරනමෙන් ප්‍රකාශ කර ශාන්ත ජෝන් නිළධාරීන් විසින් ලාංඡන, ලිපි ශීර්ෂ සහතික සහ පදක්කම් භාවිත කල යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලදි.
2. ශාන්ත ජෝන් වැඩසටහන් - කිට්/ප්‍රථමාධාර පුහුණු/ සේවාවන් කටයුතු කිරීමේදී නිවැරදි ලෙස භාවිත කල යුතු ලේඛන පිළිබඳ සිහිපත් කල අතර සංඛ්‍යා ලේඛන පවත්වා යමින් මූලස්ථානයට වාර්තා කිරීමේ වැදගත්කම සදහන් කරන ලදි.
3. සියලුමදෙනා හඳුනා ගැනීම ආරම්භ කරන ලදි.
4. සහකාර කොමසාරිස්වරුන්ගේ කාර්ය වනුයේ අදාල විෂය ජාතික මට්ටමින් සැලසුම්කරණය බව ප්‍රකාශ කරන ලදි.

**2024/DC Meeting Agenda – 04**

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් ආර්. සිතිජ ප්‍රියංකර ප්‍රනාන්දු - කැඩෙට් භාර සහකාර කොමසාරිස්තුමා වෙත ශාන්ත ජෝන් කැඩෙට් විෂය කටයුතු දැනුවත් කිරීමට අවස්ථාව ලබා දුනි.**

5. නිවැරදිව හා පිළිවෙලට කැඩෙට් නිළ ඇඳුම පැළඳීම පිළිබඳව හා පාසල් සමඟ කටයුතු කරගෙන යාම ගැන අවබෝධ කර ගැනීම පිළිබඳව පැහැදිලි කිරීමක් ඔහු විසින් ආරම්භ කරන ලදි. එහිදී සියලුම දෙනා සමඟ සමාලෝචනය වූ කරුණු පහතින් දැක්වේ.

- ✓ පාසල් නිළ ඇඳුමට පාසලේ අනුමැතිය මත ශාන්ත ජෝන් Cadet Breast Badge පැළඳිය හැකිය.
- ✓ පාසල් නිළ ඇඳුමට Shoulder Flash පැළඳිය නොහැකිය.
- ✓ කැඩෙට් ශිෂ්‍ය භටයන් පාසල් ළමුන් වන අතර නිලධාරීන් නොවන බැවින් ඔවුන්ට Paek Cap, Cross Beld පැළඳිය නොහැකිය. මේ සදහා සියලුම දෙනාගේ එකලත්වය පලවුනි
- ✓ Lanyard ඕනෑම අයෙකුට පැළඳිය හැකි අතර එය දැනට අනිවාර්ය අංගයක් ලෙස නොසැලකීමට තිරණය විය.
- ✓ කළු සුදු ශාන්ත ජෝන් නිළ ඇඳුමට ටයි පැළඳිය නොහැකිය.
- ✓ කැඩෙට් ශිෂ්‍ය භට ගැහැණු ළමුන් සඳහා කළු කලිසම සහ කළු සාය දැනට පැළඳිය හැකි නමුත් ජාතික මට්ටමේ කඳවුරු සහ වැඩසටහන් සඳහා කළු කලිසම අනිවාර්ය වේ. මින් ඉදිරියට හැකි සෑම අවස්ථාවකදීම කළු කලිසම සදහා පෙළඹවිය යුතු බව සදහන් වුනි
- ✓ දිවුරුම් දීම පහනක් සහිතව හෝ රහිතව සිදු කල හැකි අතර පහනක් සහිතව නම් ආරක්ෂාකාරී ඉරියව්වකින්ද පහනක් රහිතව නම් අත ඉදිරියට දිගු කිරීම හෝ අංශක අනුවට නවා හෝ කල හැකිය. පහන තබා ගැනීමේදී වෙනත් ක්‍රමවේද ( මල් පීරිසි වැනි) භාවිතා නොකළ යුතු බව සදහන් විය
- ✓ උත්සව පැය 02 කට සීමා කිරීම හා නර්තන අංග 02කට වඩා නොයෙදීම, ශාන්ත ජෝන් වැඩසටහන් සඳහා පලදායි අංගයක් එකතු කිරීම යෝජනා විය.
- ✓ කැඩෙට් ශිෂ්‍ය භට ළමුන්ගේ දිවුරුම් දීමෙන් මාස 06 ක පරිවාස කාලයකට පසුව Cadet Membership Certificate ලබා දීමට කටයුතු කිරීම වඩාත් උචිත බව ප්‍රකාශ විය.

- ✓ පාසල් ගුරුවරුන් සඳහා ශාන්ත ජෝන් ප්‍රාදේශීය නිළධාරී Divisional Officer තනතුර ලබාදෙන බැවින් දිස්ත්‍රික් කොමසාරිස් මගින් මුල් පත්වීම් ලිපියක් ලබා දීමට කටයුතු කරන්න. මන්ද අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී කටයුතු ඉටු කරන ගුරුවරුන් ඇගයීම් වන විට ලිඛිත ඉදිරිපත් කිරීම් වලදි පත්වීම වැදගත්ය.
- ✓ පාසල් ළමුන් සඳහා ද අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී කටයුතු වල නිරත වු බව සනාථ කිරීමට වන විට ලිඛිත ඉදිරිපත් කිරීම් වලදි පත්වීම, පුහුණු සහතිකය, සම්මාන වැදගත් වන හෙයින් කැඩෙට් වැඩසටහන් වල A1,A2,A3 සහ B1,B2,B3 මේ වනවිට දිස්ත්‍රික් මට්ටමින් සිදු කල හැකිය. වර්ෂ 2025 පසුව කැඩෙට් වැඩසටහනේ මහජන සේවා පදක්කම නොමැති අය ජාතික රාජකාරීන් සඳහා සහභාගි කරවිය නොහැක.

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් නැවත දැනුවත් කල විෂයන්**

6. රෝහල් පුහුණු සිදු කිරීමේදී අපගේ පරමාර්ථ ඉටුවන පරිදි විෂය මාලාවක් අනුව එම කටයුතු කරගත යුතු බවත් අනාගතයේදී සියලුම රෝහල් දැනුවත් වන පරිදි ලිපියක් සහ පොදු ක්‍රියාකාරී සැලස්මක් සකස් කිරීමටත් තීරණය විය එසේම රෝහල් සොවාවලට යෙදවිය යුත්තේ අවම වශයෙන් වසරක කාලයක් වත් ස්වෙච්ඡා කටයුතු වල නිරතවු සාමාජිකයින් විය යුතුය.
7. 2024-01-29 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී ශාඛාවෙන් පැවැත්වූ රැස්වීමට සහභාගි වු අතර ඉන් අනාවරණය කර ගත් කරුණු අනුව බාහිර ආයතන මගින් පාසල් පද්ධතිය තුළ සිදු කරන වැඩසටහන් සඳහා පූර්ව අනුමැතියක් හා විධිමත් අනුමැතිය ලබා ගත යුතු බව දැනුවත් කරන ලදි. වැඩි විස්තර ඉදිරියේදී ලිඛිත පෝරමයක් සකස් කර ලබා දෙන බව සඳහන් කරන ලදි.
8. විෂය සමගාමී බාහිර ආයතනයක් වන ශාන්ත ජෝන් අපගේ වැඩසටහන් වල සාර්ථක සහභාගි වු දරුවන් සඳහා අගයක් ලබා දීමට නම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) වෙත ශාන්ත ජෝන් වැඩසටහන් විෂය නිර්දේශය හා යෝජනා පත්‍රය සමග ආසන්න වසර 04 තොරතුරු සංඛ්‍යා ලේඛන/ පර්යේෂණ ක්‍රමවේදය සකස් කර යැවිය යුතු වේ. මේ සදහා පළමුව කැඩෙට් වැඩසටහනද ස්ථාවරව කළහැකි තත්වයට පත්කළයුතුව ඇත

**සියලුම දෙනා සමඟ සමාලෝචනය වු කරුණු**

9. ශාන්ත ජෝන් ගිලන් සේවයේ නිළධාරීන් හා සාමාජිකයන්ට දිස්ත්‍රික් මට්ටමින් පිරිනමන ඇගයීම් සහතික හා පදක්කම් ද කඳවුරු සහතික හා පදක්කම් සිදු කල යුතු ආකාරය පිළිබඳව අදහස් ප්‍රකාශ විය.
- ✓ නේවාසික කදවුරු සඳහා Gold /Silver/ Bronze යටතේ සහතික හා පදක්කම් ලබා දිය හැකි අතර අවම දින 03 ක රාත්‍රී 02 ක් සහිත කඳවුරු සදහා පමණක් විය යුතුය. ප්‍රධාන කොමසාරිස් තුමාගේ අනුමැතිය සඳහා දිස්ත්‍රික් කොමසාරිස් මගින් නාම ලැයිස්තු ඉදිරිපත් කල යුතු වේ.
- ✓ පදක්කම් සදහා ජාතික මට්ටමේ ආකෘතිය, ප්‍රමාණය, පිළිවෙත මුලස්ථානය වෙත යොමු කරන්න.
- ✓ ජ්ලාස්ටික් පදක්කම් දිස්ත්‍රික් කඳවුරු ඇගයීම් ලෙස 100 කට 25 ක ප්‍රතිශතයක් ලෙස උපරිම පරීක්ෂණයකට ලක් කර ලබා දිම.
- ✓ කඳවුරු ඇගයීම් කමිටුව මගින් නිර්ණායක සකස් කිරීම උදාහරණ ලෙස කථිකත්වය සලකා බැලීම
- ✓ දිස්ත්‍රික් මට්ටමින් පිරිනමන පදක්කම් වසර 05 කට වලංගු පරිදි පැළදිය හැකිය
- ✓ ඉදිරියේදී ජාතික කඳවුරු සඳහා සහභාගි විය හැකි නිර්ණායකයක් ලෙස ක්‍රමවේදයක් තුළින් ප්‍රාදේශිය ලෙස, කලාප ලෙස, දිස්ත්‍රික්ක ලෙස හා අවසානයේ ජාතික මට්ටමින් අනු පිළිවෙළකට පෙළගැස්මක් සකස් කල යුතුය.
- ✓ ශාන්ත ජෝන් නිළ ඇඳුමේ පදක්කම් පැළඳීම මෙසේ සදහන් කරන ලදි. නිළ ඇඳුමේ පපු පෙදෙස වම්පස ජාත්‍යන්තර හා ජාතික පදක්කම් සඳහාත් නිළ ඇඳුමේ පපු පෙදෙස දකුණු පස සාක්කුවට මධ්‍යව Cadet Badge පැළඳිය යුතු අතර එතැන සිට බොත්තම් පැත්තට දිස්ත්‍රික් පදක්කම් පැළඳීම කල හැකි බව තීරණය විය.
- ✓ ජාතික කඳවුරු සඳහා සහභාගි වන දිස්ත්‍රික් කණ්ඩායම් A,B,C,D ලෙස මිශ්‍රව යොදා තරග වලදී පමණක් දිස්ත්‍රික් මට්ටමින් ඇගයීම් කිරීම සුදුසු බව

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් නැවත දැනුවත් කල විෂයන්**

10. 2025 ජාතික කැඩෙට් කඳවුර දිස්ත්‍රික් තුළ සඳහා පැවැත්වීමට ඉල්ලුම් කල හැකි අතර සුදුසුකම් ලැබිම සඳහා පහත කරුණු සපුරා තිබිය යුතුය.
- ✓ දිස්ත්‍රික්කයේ අවම සහකාර කොමසාරිස්වරුන් 04 සිටිය යුතු වේ. දිස්ත්‍රික්කයේ අවම කැඩෙට් කඳවුරු 06 පවත්වා තිබිය යුතු වේ. දිස්ත්‍රික්කයේ 2022 වසරේ විගණන වාර්තා තිබිය යුතු වේ. දිස්ත්‍රික්කයේ විනය විරෝධි වාර්තා නොතිබිය යුතු වේ.

11. 2024 දෙසැම්බර් / 2025 ජනවාරි හෝ පෙබරවාරි මාසයන් වල ජාතික කැඩෙට් කඳවුර පැවැත්වීමට යෝජනා වු අතර මාස 08 කටවත් පෙර සුදානමක් ඊට අවශ්‍යය බවත්, දිස්ත්‍රික් වල යෝජනා තව මාසයක් තුළ සලකා බැලීමටත් තීරණය විය.

12. කැඩෙට් හා කිට් වැඩසටහන් දිස්ත්‍රික්ක තුළ ව්‍යාප්ත කිරීම සඳහා දිස්ත්‍රික් සම්පත්දායකයින් ලෙස ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන නිළධාරීන් තෝරා ගෙන පුහුණු වැඩසටහන් පවත්වා ඒ සඳහා දිස්ත්‍රික්කයේ මුදල් වැය කර හෝ දිස්ත්‍රික්කයේ උන්නතිය උදෙසා ඔවුන් සකස් කරගෙන කිට් - සහකාර කොමසාරිස්, කැඩෙට් - සහකාර කොමසාරිස් වැනි තනතුරු ලබාදී දිස්ත්‍රික්ක කටයුතු පවත්වාගෙන යාම. ZOOM මගින් TOT පැවැත්වීම
13. මෙතෙක් තනතුරු ලබා දීමට පිළිවෙත් නොතිබුන අතර ඒ සඳහා සුදුසු සම්මත ක්‍රමවේදයන් දැනට බොහෝදුරට සකස් කර ඇති අතර සෑම තනතුරක් සඳහාම වයස හා අත්දැකීම් අනුව ඉදිරියට ගමන් කල හැකි ක්‍රමයක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි.
14. **දිස්ත්‍රික් කොමසාරිස්** තනතුර පුහුනු කිරීමේ නිලධාරී තනතුරක් නොවන බවත් ඔහුගේ ප්‍රධාන කාර්ය වන්නේ මානව සම්පත් / මුල්‍ය කලමනාකරණය සහ ප්‍රචාරණයයි

**2024/DC Meeting Agenda – 05**

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් ඒ.ආර්.එම්. ෆාසිල් - කිට් භාර සහකාර කොමසාරිස්තුමා වෙත ශාන්ත ජෝන් කිට් විෂය කටයුතු දැනුවත් කිරීමට අවස්ථාව ලබා දුනි. එතුමා විසින් පහත කරුණු සඳහන් කරන ලදි.**

15. 2024 ජාතික කිට් කඳවුර ඔක්තෝබර් මසදී පැවැත්වීම
16. කිට් ගුරුවරුන් ඇගයීම සඳහා කැඳවීම වසරකට එක් වතාවක්වත් පැවැත්වීම.
17. 2024 ජාතික කිට් කඳවුර පැවැත්වීමේ නිර්ණායක කිට් කඳවුර පැවැත්වීමට සුදුසුකම් ලබන දිස්ත්‍රික්කය විසින් ඉදිරිපත් කිරීම.
18. දිස්ත්‍රික්කයකට එක් අයෙකු බැගින් හෝ කිට් සහ කැඩෙට් නිළධාරීන් පත් කිරීම.

**2024/DC Meeting Agenda – 06**

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් ඩී.කේ. ගාමිණි ප්‍රියනාත්- ජාතික රාජකාරි භාර සහකාර කොමසාරිස්තුමා වෙත ශාන්ත ජෝන් ජාතික රාජකාරි සේවා විෂය කටයුතු දැනුවත් කිරීමට අවස්ථාව ලබා දුනි. එතුමා විසින් පහත කරුණු සඳහන් කරන ලදි.**

19. දිස්ත්‍රික්කයක් මගින් ජාතික රාජකාරි සිදු කරන විට දී ප්‍රධාන කොමසාරිස් තුමා හෝ ජාතික රාජකාරි භාර සහකාර කොමසාරිස්වරයා අනිවාර්යෙන් දැනුවත් කළ යුතු බව ප්‍රකාශ කරන ලදි.
20. ජාතික රාජකාරි ඉටු කිරීමට පෙර හා පසු යොමු කල යුතු ලිඛිත වාර්තා නිවැරදි පිළිවෙතට යොමු කළ යුතු බව ප්‍රකාශ කරන ලදි.
21. කිසියම් සේවාවක් සදහා ආධාර එකතු කරන්නේ නම් ඒ බව ප්‍රධාන කොමසාරිස් තුමා දැනුවත් කර අදාල පූර්ව අවසරය ලබාගත යුතු බවත් සියලුම මුල්‍යමය කටයුතු අපගේ නීතිරීති අනුව පමණක් සිදුකල යුතු අතර මුදල් වැය කිරීමට පෙර දිස්ත්‍රික් ගිනුමට බැර කිරීම සහ අනුමත රිසිට්පත් නිකුත් කිරීම අනිවාර්ය බව ප්‍රධාන කොමසාරිස් තුමා සිහිපත් කරන ලදි
22. දැනට පවතින ආර්ථික තත්වයන් තුළ සේවාවන් සදහා අවශ්‍ය අධික වියදම සොයා ගැනීම අපහසු බැවින් අනාගත යේදී ජාතික රාජකාරි අදාල දිස්ත්‍රික්ක වෙත පැවරීමට කටයුතු කරන බවත් සදහන් විය පලමු පියවර වශයෙන් දැනටම කතරගම රාජකාරි මොණරාගලට භාරදී ඇති අතර 2024 අනුරාධපුර රාජකාරි අනුරාධපුරයටම භාරදෙන බවත් ඉදිරියේදී සිරිපාද සේවය නුවර එළිය සහ රත්නපුර දිස්ත්‍රික්ක සදහා භාරදීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි වෙනත් දිස්ත්‍රික්ක සදහා අවශ්‍ය අවස්ථා ලබා ගැනීමට නම් ඔවුන් කටයුතු කිරීමට යන ආකාරය ව්‍යාපෘති වාර්ථාවක් ලෙස ප්‍රධාන කොමසාරිස් සහ ජාතික රාජකාරි භාර සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය

**2024/DC Meeting Agenda – 08**

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් ඩී. නිර්මල අමරවික්‍රම - වැඩිහිටි භාර සහකාර කොමසාරිස්තුමා වෙත ශාන්ත ජෝන් වැඩිහිටි වැඩසටහන් විෂය කටයුතු දැනුවත් කිරීමට අවස්ථාව ලබා දුනි. එතුමා විසින් පහත කරුණු සඳහන් කරන ලදි.**

23. ශාන්ත ජෝන් නිළධාරීන් ලෙස ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ පිළිගැනීමක් ඇති බැවින් ටි ෂර්ට් පැලද රාජකාරි කිරීම නොසුදුසු බව ප්‍රකාශ කරන ලදි.
24. වැඩිහිටි වැඩසටහන් ලෙස ආපදා කළමනාකරණ දිස්ත්‍රික් මට්ටමේන් පවත්වාගෙන යාම උදාහරණ ලෙස ත්‍රිවිල් සංගම් සඳහා ප්‍රථමාධාර වැඩසටහන් පැවැත්වීම
25. ශාන්ත ජෝන් වැඩිහිටි භාර සහකාර කොමසාරිස් වශයෙන් ජාතික මට්ටමේ ශාන්ත ජෝන් වැඩිහිටි සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන කොමසාරිස් තුමා ඉල්ලා සිටින ලදි

**ප්‍රධාන කොමසාරිස්තුමා විසින් ඒ.සී.එම්. ඉන්ෂාෆ් - ව්‍යාපෘති භාර සහකාර කොමසාරිස්තුමා වෙත ශාන්ත ජෝන් ව්‍යාපෘති විෂය කටයුතු දැනුවත් කිරීමට අවස්ථාව ලබා දුනි. එතුමා විසින් පහත කරුණු සඳහන් කරන ලදි.**

26. සේවා සම්මාන උළෙල හෝ විශිෂ්ඨ සේවා ඇගයීම් පැවැත්විය යුතු අතර ඒ සඳහා මුලින්ම වැය වන මුදල් උපයා ගත යුතු ආකාරය පැහැදිලි කර යෝජනා කරන ලදි.

- ✓ අපගේ ශක්තිය සහ දුර්වලතා හදුනා ගැනීම
- ✓ අවස්ථාවන් සහ තර්ජන හදුනා ගැනීම
- ✓ ව්‍යාපෘති කාල රාමුවක් තුළ සියල්ල සැලසුම්කරණය

පැමින සිටි සියලුම දෙනා වෙත ස්තුතිය පළකර රැස්වීම පව 3 00 ට අවසන් කරන ලදි

වාර්ථාව සකස් කලේ රොෂානි පෙරේරා සන්නිවේදන නිලධාරී ප්‍රධාන මූලස්ථානය

අනුමත කලේ විශෙෂඥ වෛද්‍ය ජේ ඇම් නිලාම් ප්‍රධාන කොමසාරිස්

සිංහල වාර්ථාව නිකුත් කළ දිනය 2024 මාර්තු මස 04 දින